# ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය

එම් එම් එස් ඒ මාරසිංහ (සහකාර කථිකාචාරිණී)


මිනිසා විසින් සිදුකරනු ලබන ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එනම් ප්‍රාථමික, ද්විතිය, තෘතීය වශයෙනි. ආර්ථික කටයුතු ප්‍රසාරණය වීමත් සමඟ මීට අමතරව තවත් ආර්ථික කටයුතු දෙකක් දැකිය හැකිය. ඒවා නම් චාතුර්තික සහ පශ්චිම වශයෙනි. මෙම ආර්ථික ක්‍රියාවන්ගේ ස්වරූපය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම්වලට බොහෝදුරට කෘෂිකර්මය, දැව, වන, ධීවර, පතල් ආදී කටයුතුත් (පරිසරයේ ඇති ද්‍රව්‍ය වෙනස් කිරීමකින් තොරව භාවිතා කිරීම) ද්විතිය ආර්ථික ක්‍රියාකාරකම්වලට යකඩ හා වානේ කර්මාන්තය, මෝටර් රථ, ඇඟළුම් කර්මාන්තය යන ඒවා උදාහරණ වේ. (අමුද්‍රව්‍ය අඩක් හා සම්පූර්ණ වශයෙන් වෙනස් කරමින් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම) තෘතීය ආර්ථික කටයුතු සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය, රක්ෂණ ආදී කටයුතු අදාල වේ. (යම් කිසි සේවාවක් සැපයීම සිදු කරයි). චාතුර්තික හා පංචමික ආර්ථික කටයුතු නිරන්තරයෙන් ම අධි තාක්ෂණය මත ක්‍රියාත්මක වන විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කරනු ලබන කර්මාන්තයන් ය. බොහෝදුරට මේවා සංවර්ධිත රටවල් වල ක්‍රියාත්මක වේ. මෙම ලිපියෙහි මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ කර්මාන්ත පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමයි.

නිෂ්පාදන කර්මාන්තයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඒ පිළිබඳ විවිධ නිර්වචන දක්නට ලැබේ. නිෂ්පාදනයක් යනු කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් නිර්මාණය කිරීම යනුවෙන් හැඳින්විය හැකිය. මෙම ක්‍රියාවලියට විවිධ සාධක වල ඒකරාශී වීමක් තිබිය යුතුය. භූමිය , ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යන මූලික සාධක ඒ අතර ප්‍රධාන වේ. මෙම සාධක අවස්ථා කිහිපයක ඒකාබද්ධතාවයකින් පවත්නා අතර නො නවතින ක්‍රියාවලියකි. නිෂ්පාදන ක්‍රියාවලියක් (Production Process) වශයෙන් නිෂ්පාදන කර්මාන්තය හැඳින්විය හැකිය. මේ සියලු තත්ත්වයන් තුළ නිෂ්පාදන කර්මාන්තය පහත පරිදි නිර්වචනය කළ හැකිය.

"අමුද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් යොදවමින් කිසියම් ශ්‍රම සංවිධානයක් විසින් හා තාක්ෂණයේ භාවිතයත් ප්‍රයෝජනයට ගනිමින් යෙදවුම් වලට වෙනස් වන්නා වූ නිෂ්පාදනයක් බිහි කරන සජීවී ක්‍රියා පද්ධතියක් වශයෙනි". (ජයතිලක, 1995)


නිෂ්පාදන කර්මාන්තයක් මේ ආකාරයට අමුද්‍රව්‍යයක් නිමි ද්‍රව්‍යයක් බවට පත් කරන ස්ථානයකි. මෙම කර්මාන්තවල ස්වරූපය අනුව ඒවා වර්ග කිරීමේ ස්වරූපයක්

පවතී. අමුද්‍රව්‍යවල ස්වරූපය, නිෂ්පාදනයේ ස්වරූපය, කර්මාන්තයේ සේවකයන්ගේ ප්‍රමාණය, ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය, සේවකයන්ගේ ගුණාත්මක භාවය යන සාධක මේ සඳහා උපයෝගී කර ගත හැකිය. පහත දැක්වෙන්නේ එක් කර්මාන්ත වර්ගීකරණයකි.




ශ්‍රී ලංකාවේ මහා පරිමාණ කර්මාන්ත වැඩිවශයෙන් ම ස්ථාන ගත වී ඇත්තේ අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව සලසාගෙනය. වාලච්චේන කඩදාසි, කන්ක-සන්තුරේ. පුත්තලමේ සිමෙන්ති, ගිංතොට තුනී ලෑලි, කන්තලේ සීනි වශයෙන් හඳුනාගත හැකිය. නමුත් කැලණි ටයර්. ටියුබ් හා සපුගස්තැන්නේ තෙල් පිරිපහදුව ආදිය පිහිටුවීමේදී පරිවහනය පහසුව සලකා බලා ඇත. මෙම මහා පරිමාණ කර්මාන්ත ශාලාවල විශේෂත්වය වන්නේ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා විශාල වශයෙන් මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමයි.

**මහා පරිමාණ කර්මාන්ත වල ව්‍යාප්තිය**




සිතියම් අංක 01

### මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත

මහා පරිමාණ කර්මාන්ත රජයේ ප්‍රාග්ධනය යොදවා ආරම්භ කර ඇති අතර මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත ක්‍රියාත්මක කරනුයේ පෞද්ගලික අංශය මගිනි. කුඩා පරිමාණයේ කර්මාන්ත සඳහා ඇඟළුම්, ප්ලාස්ටික්, ලෝහ භාණ්ඩ, විදුලි උපකරණ, පළතුරු ටින් කිරීම වැනි කර්මාන්ත අයත්වේ. කුඩා පරිමාණ කර්මාන්ත වලින් 66% කට වඩා බස්නාහිර පළාත තුළ පමණක් ස්ථානගත වී ඇත. මේ කර්මාන්තයන් සඳහා විශාල ශ්‍රමයක් අවශ්‍යවීමත් වෙළෙඳ පහසුකම් ප්‍රවාහන පහසුකම් ආදිය සලකා බැලීමේදී යෝග්‍ය ස්ථානයක් ලෙස කර්මාන්ත පිහිටුවීමට තෝරාගෙන අත්තේ බස්නාහිර පළාත වේ.

කුඩා පරිමාණ කර්මාන්ත වල ආයෝජකයින් බොහෝ දුරට පෞද්ගලික අංශයේ නිසා ම ඔවුන්ට අවශ්‍ය දැනුම, තාක්ෂණය, අවශ්‍ය මග පෙන්වීම් කුඩා පරිමාණ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. එමෙන්ම ණය ලබාදීම, අමුද්‍රව්‍ය ගෙන්වාදීම දේශීය විදේශීය වෙළෙඳපොළ සපයා දීම වැනි අංශයන්ට ද රජයේ අවධානය යොමු කරයි.

### මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත ව්‍යාප්තිය



#### ගෘහ කර්මාන්ත

ගෘහ කර්මාන්ත ලෙස හඳුන්වනු ලබන්නේ ඉතා කුඩා පරිමාණයේ කර්මාන්ත විශේෂයකි. මෙය ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ වැදගත් තැනක් හිමිකර ගනී. ගෘහ කර්මාන්ත සඳහා අනෙක් කර්මාන්ත ස්ථනගත කිරීමේ දී මෙන් විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය නොවේ. එමෙන්ම ශ්‍රමය, යන්ත්‍ර සූත්‍ර ද අවශ්‍ය නොවේ. අවශ්‍ය අවස්ථාවල දී පමණක් කුඩා අත් යන්ත්‍ර, විදුලි බලයෙන් ක්‍රියාකරන සරල යන්ත්‍ර පමණක් භාවිතා කරයි. මෙවැනි සූක්ෂම ක්‍රම හා ශිල්පීය හැකියාවන් භාවිතය නිසා ගෘහ කර්මාන්ත හස්ත කර්මාන්ත වශයෙන් ද හඳුන්වයි. බොහෝ හස්ත කර්මාන්ත සඳහා අතීතයේ සිටම ප්‍රසිද්ධියට පත්වූ

ප්‍රදේශ දැකිය හැකිය. මාතර බීරලු, අම්බලන්ගොඩ වෙස් මුහුණු, කළුතර ඉදිකොළ, ගාල්ල - කළුවර ලී කැටයම් මේ ආකාරයට ප්‍රසිද්ධ වූ ප්‍රදේශයන් ය. රජය විසින් මෙම කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, අමුද්‍රව්‍ය සැපයීම, ණය පහසුකම් ලබාදීම, අලෙවි පහසුකම් සැපයීම යනාදී මැදිහත් වීම් සිදු කරයි.

ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික ලක්ෂණ මත ඉතා යෝග්‍ය ම කර්මාන්ත වර්ගය වන්නේ ගෘහ කර්මාන්ත ය. ඒ සඳහා රටේ අමුද්‍රව්‍ය (සම්පත්) භාවිතා කළ හැකි වීම, විශාල ශ්‍රමිකයන් පිරිසකට රැකියා ලබාදිය හැකි වීම, යොදවන ප්‍රාග්ධනය රටේම ඉතිරි කරගත හැකි වීම, යන සාධක මත වාසිදායකය. ඊට අමතරව ගෘහ කර්මාන්තය ආරම්භ කිරීම සඳහා සුළු ප්‍රාග්ධනයක් ප්‍රමාණවත් වීමත් සහ අතිරේක ආදායම් ලබා ගත හැකි ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය කිරීමේ හැකියාවක් ද පවතී. මීට අමතරව දේශීය කලා සම්ප්‍රදායන් හා සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමටත් හැකියාව පවතී.

**ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ විකාශනය**

ශ්‍රී ලංකාව මීට ශත වර්ෂ කිහිපයකට පෙර මුළුමනින් ම කෘෂිකාර්මික රටකි ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන වෙනස්වීම් සිදු වූයේ බ්‍රිතාන්‍ය පාලන කාලයේදී ය. කෙසේ වෙතත් 1930 ගණන් වලදී ත් ශ්‍රී ලංකාවේ කර්මාන්ත බෙහෙවින් ම සීමා වී තිබුණත් තේ, පොල්, රබර් යන වැවිලි නිෂ්පාදන පිළියෙල කිරීමටය. ඊට අමතරව කුඩා පරිමාණයේ කර්මාන්ත දක්නට ලැබේ. රෙදි විවීම, බීර නිෂ්පාදනය, මෙවලම් නිෂ්පාදනය, ආදියත් මීට අමතරව පුරාණයේ සිට පැවත එන ලෝහ වැඩ, වළං තැනීම, වේවැල් වැඩ ආදී ජන ජීවිතයට අවශ්‍ය භාණ්ඩ සම්පාදනය වශයෙන් ග්‍රාමීය ප්‍රදේශවල වැදගත් කොටසක් ලෙස පවත්වාගෙන එනු ලබයි. (විජේසේකර1986) මේ කාලයේදී ශ්‍රී ලංකාවේ අපනයනය කරන ලද්දේ ප්‍රාථමික නිෂ්පාදනයන්ය.

ශ්‍රී ලංකාවේ 1934 - 1935 කාලයේදී කර්මාන්ත සංවර්ධනය අතින් වැදගත් පියවරයන් දෙකක් ගනු ලැබිණ. එනම් රාජ්‍ය බැංකුවක් පිහිටුවීමත් දේශීය වෙළෙඳපොළට භාණ්ඩ සැපයීමත් අරමුණු කොටගෙන නව කර්මාන්ත රජය විසින් ආරම්භ කිරීමත් ය. මේ යටතේ කොහු (1937) යකඩ (1941) ඖෂධ (1943) කඩදාසි (1942) වීදුරු (1944) පිඟන් භාණ්ඩ (1944) ආදී වශයෙන් කර්මාන්ත ස්ථානගත කරනු ලැබිණ.

1939 කාලය වන විට ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස් වීම වූයේ වෙළෙඳපොල අමාත්‍යංශය පිහිටු වීමයි. මීට අමතරව මෙම අංශයේ සම්බන්ධතාවයන් ඇති කිරීම පිණිස දේශීය ආයෝජකයන්ට විවිධ දිරිදීමනා ලබා ගැනීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ 1948 න් පසු කාලය ගත් විට බලයට පත්වන රජයන්ගේ සමාජීය ආර්ථික කරුණු අනුවත් දේශපාලන ප්‍රතිපත්ති අනුවත් විටින් විට වෙනස් වී තිබේ. 1952 න් පසුව ලෝක බැංකු නියෝජිත වාර්තාවට අනුව රජය කාර්මික ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සකස් කරන ලදී. මේ මගින් රජයේ මැදිහත් වීමෙන් විශාල කර්මාන්ත කිහිපයක් වෙනුවට කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත රාශියක් පිහිටුවීමට තීරණය කරන ලදී. 1959 වන විට මේ ලෙස පිහිටුවන ලද කර්මාන්ත සංස්ථා බවට පත් කරන ලදී. ඒ සමගම විදේශීය හා පෞද්ගලික ආයෝජන පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමේ ධවල පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කොට නව කර්මාන්ත ආරම්භ කිරීමට අවස්ථාව ලබා දී ඇත.

මීට අමතරව 1960-65 කාලයේදී ශ්‍රී ලංකාවේ ආනයන ආදේශන කර්මාන්ත බිහි විය. මෙම ක්‍රියාමාර්ගයට මූලික හේතුව වූයේ විදේශීය සංචිත ප්‍රමාණය පහළ වැටෙමින් තිබීමයි. මෙහි දී දේශීය කර්මාන්ත සඳහා ඉහළ ආරක්ෂණයක් ලබා දෙමින් ආනයන ආදේශන කර්මාන්ත පිහිටුවීමට උත්සාහ දරා ඇති අතර ඒවුන් දිරිමත් කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ

1. අවුරුදු පහක් සඳහා ශුද්ධ ලාභ වලින් කොටසක් ගෙන සම්පූර්ණයෙන් ම ආදායම් බදු වලින් නිදහස් කිරීම.
2. පිරියත සහ යන්ත්‍ර මිලදී ගැනීම සඳහ 20% ක බදු ප්‍රතිපාදනයක් ලබාදීම සහ අනුමත ව්‍යාපෘති වෙනුවෙන් මෙම ප්‍රතිපාදන දෙගුණයක් ලබාදීම.
3. ක්ෂය වීමේ දීමනා ලබාදීම.
4. උපකරණ සහ අමුද්‍රව්‍ය සඳහා සහනදායි ආනයන බදු අනුපාතිකයක් ලබාදීම.
5. කුඩා පරිමාණයේ පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත ඇති කිරීම සඳහා පෞද්ගලික අංශය සමග රාජ්‍ය අංශයේ සහභාගීත්වය.
6. කාර්මික ආනයන සඳහා ණය පහසුකම් ලබා දීම.
7. ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ කාර්මික පරීක්ෂණ ආයතන හා සුළු පරිමාණ සහ කුඩා පරිමාණ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික සහාය ලබාදීම.
8. ආයත පාලන, බදු ගැලපීම් සහ කාර්මික නිෂ්පාදන පනත මගින් දේශීය කර්මාන්ත කරුවන් ආරක්ෂා කිරීම.
9. රජය විසින් එම කාර්මික නිෂ්පාදන මිලදී ගැනීම ආදියයි.

(ශ්‍රී ලංකා මහ බැංකුව-1998)

මෙම කරුණුවලට අමතරව පෞද්ගලික අංශයේ විදේශීය ආයෝජකයින්ට ද අවස්ථාවන් ලබාදී ඇති ඔවුන් සඳහා පහත සඳහන් ආකාරයේ අවස්ථාවන් ඇති කර ඇත.

1. ලාභාංශ විදේශ රටවලට යැවීම සහ වරණීය බැඳීම්වලින් තොරව විදේශයට යැවීමට අවසර දීම.

2. අවශ්‍ය තාක්ෂණය සහ කළමනාකරුවන් ගෙන්වා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම.

3. ගෙන්වා ගන්නා කළමනාකරුවන්ට ඔවුන්ගේ ඉපැයීම්වලින් කොටසක් පිටරට ප්‍රේරණය කිරීමට අවසර දීම.

4. රජය අතර ඇතිකරගනු ලබන එකඟතාවයන් මත ද්වන්ධ බදුකරණය වැලැක්වීම සඳහා ප්‍රතිපාදන සැපයීමට රජය ප්‍රතිපත්තියක් ලෙස එකඟ වීම.

මෙවැනි අවස්ථාවන් ඇතිකිරීම මගින් දේශීය කර්මාන්ත අංශය නගාසිටුවීම සඳහා උත්සාහ ගන්නා ලදී. 1965-70 කාලයේදී පෞද්ගලික අංශයේ කර්මාන්ත සඳහා වැඩි අනුබලයක් ලබාදී තිබේ. 1965 බලයට පත්වූ රජය මගින් ආනයන ආදේශන කාර්මිකරණ ප්‍රතිපත්ති රාමුව තළ අපනයන ප්‍රවර්ධන කර්මාන්තවලට වැඩි අවධායන් යොමුකර ඇත. අනෙක් වැදගත් කාර්යය වන්නේ 1965 දී භාණ්ඩවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රමිති කාර්යාංශයක් පිහිටුවනු ලැබීමයි. 1969 දී කාර්මික සංවර්ධන මණ්ඩලය පිහිටුවීම තුළින් කර්මාන්ත සංවර්ධනය සඳහා කාර්මික සේවා පහසුකම් ලබාදීම, යන්ත්‍ර සහ අමුද්‍රව්‍ය ආනයනය කිරීම, තාක්ෂණික උපදෙස් ලබාදීම ආදිය සිදුකර තිබේ.

1970 න් පසු කාලය ආනයන ආදේශන ප්‍රතිපත්ති ගැන නියමයක් විය. 1977 කාලය වන තුරුත් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය. මේ කාලය තුළ 1966 කාලයටත් වඩා රජයේ මැදිහත් වීම සිදුකර ඇත. 1971 වන විට සම්ප්‍රදායික නො වන අපනයන දිරිමත් කිරීම සඳහා පරිවර්තන ගිණුම් ක්‍රමය හඳුන්වාදෙන ලදී. මේ යටතේ සම්ප්‍රදායක නොවන භාණ්ඩ අපනයන කරුවන්ට ඔවුන්ගේ අපනයන වලින් 25% ක් මෙම ගිණුම් තුළ තබා ගැනීමටත් එම මුදල් විදේශ විනිමය පාලනයට යටත් කර ඇති කටයුතු වෙනුවෙන් සහ සීමාවන් පනවා ඇති ආයතනයන් වෙනුවෙන් උපයෝගී කර ගැනීමටත් අවසර ලබා දී තිබේ. මේ ආකාරයට බදු හා බදු නොවන ක්‍රම තුළින් ඉහළ ආදායමක් ලබා දීම මගින් කර්මාන්ත අංශයේ වර්ධනයක් ඇතිවිය. මේ අනුව 1960 දී ජාතික ආදායමට කර්මාන්ත නිපැයුම්වල දායකත්වය 5% ක් වූ අතර 1970 දී එම

ප්‍රමාණය 16.9% ක් දක්වා වර්ධනය විය. (ජයතිලක. 1995) මේ ආකාරයට 1975 වන විට රටේ කාර්මික නිපැයුමෙන් 60% ක් පමණ මෙකී කර්මාන්තවලින් සපුරාගෙන තිබේ. එමෙන්ම රාජ්‍ය අංශයේ රැකියාවලින් 40% ක් මෙකී කර්මාන්තවලින් ජනිත කළ අතර රටේ විදේශ විනිමය ප්‍රමාණයෙන් 90% ක් පමණ රාජ්‍ය අංශයේ කර්මාන්ත වලින් ලබාගෙන ඇත. මහා පරිමාණ කර්මාන්තවල මෙන්ම ගෘහ කර්මාන්තවල වර්ධනයක් ද මේ කාලය තුළ සිදු වී තිබේ.

1977 න් පසු ඇතිවූ ආර්ථිකයේ වෙනස් වීමත් සමග කර්මාන්ත ක්ෂේත්‍රයේ පැහැදිලි වෙනස් වීමක් සිදුවිය. මේ කාලයේදී විදේශ වෙළෙඳපල අවශ්‍යතා පදනම් කරගෙන දේශීය වශයෙන් එම භාණ්ඩ නිපදවීමේ ප්‍රතිපත්තිය (අපනයනාභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය) හඳුන්වා දෙන ලදී. එය මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත යටතේ සිදු කර ඇත. ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම, ආනයන හා විනිමය පාලන නීති ලිහිල් කිරීම, විදේශීය ධන ආයෝජකයින්ට ආර්ථිකය තුළ ඉඩ ප්‍රස්ථා ඇති කිරීම, විදේශිකයින්ට තම ලාභ රටෙන් බැහැරව ගෙන යාමට ඇති නීති සීමාවන් ලිහිල් කිරීම, අපනයන කර්මාන්ත සඳහා බදු සහන ලබා දීම සහ ලිහල් කොන්දේසි යටතේ මූල්‍ය පහසුකම් ලබාදීම, වැනි ක්‍රියාවන් රාශියක්ම ගනු ලැබීය. 1977 වන විට මහ බැංකු වාර්තාවට අනුව දළ ජාතික නිෂ්පාදිතයට කර්මාන්තවල දායකත්වය 12.6% ද රැකියා නියුක්තිකයින්ගේ කර්මාන්තවලින් 10% ක නිෂ්පාදනයනක් ද පමණක් දක්නට විය. නමුත් 1978 වන විට ප්‍රාථමික නිෂ්පාදන අංශය ඉක්මවා කාර්මික නිෂ්පාදන අංශය ඉහළ යාමක් දක්නට විය. 1978 දී කාර්මික නිෂ්පාදන අංශයේ 9% ක වැඩිවීමක් සිදු වී ඇත. කම්හල් කර්මාන්තයන්ගේ වැඩිවීම 11% ක තරම් ප්‍රමාණයකින් ද වර්ධනය කර ගැනීමේ හැකියාව ලැබී ඇත.

පහත දැක්වෙන 1987-1991 කාලය තුළ කම්හල් කර්මාන්තවල තෝරාගත් දර්ශකයන් කිහිපයකි.


| කර්මාන්ත කාණ්ඩය | | 1. ආහාර බීම වර්ග සහ දුම් කොළ | 2 රෙදිපිළි ඇගළුම් සම් භාණ්ඩ | 3. දැව සහ දැව භාණ්ඩ | 4.කඩදාසි නිෂ්පාදන | 5.රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් | 6. ලෝහ නොවන නිෂ්පාදන | 7. මූලික ලෝහ නිෂ්පාදන | 8. සැදූ ලෝහ සහ යන්ත්‍රෝපකරණ ප්‍රවාහන භාණ්ඩ |
|---|---|---|---|---|---|---|---|---|---|
| කර්මාන්ත කාණ්ඩය | 1987 | 27 | 32 | 01 | 03 | 08 | 04 | 01 | 04 |
| | 1991 | 27 | 35 | 01 | 02 | 20 | 08 | 01 | 05 |
| කර්මාන්ත කාණ්ඩය වටිනාකමේ % | 1987 | 39 | 24 | 02 | 04 | 18 | 06 | - | 07 |
| | 1991 | 40 | 25 | 02 | 03 | 07 | 14 | 01 | 09 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

1987 සිට නිමැවුම්වල සමස්ත වටිනාකම් හි වැඩිම දායකත්වයක් පෙන්නුම් කරනුයේ රෙදිපිළි සම්බන්ධව ඇඟලුම් නිෂ්පාදන් ය. වෙනත් ආහාර පාන හා දුම්කොළ සහ නිමි ඇඳුම් යන දෙක එකට එක්වී කාර්මික අංශයේ වැඩිම දායකත්වයක් හිමිකරගෙන ඇත. අඩුම දායකත්වය ලෝහ නිෂ්පාදනයන් ය.

මේ ලෙස වර්ධනය වන්නා වූ ආදායම් පහත එනම් ප්‍රාදේශීය මට්ටමට ළඟා කර වීම සඳහා ද රජයේ අවධානය යොමු කර ඇත. 1992 දී පළාත්බද කර්මාන්ත වැඩසටහන් යටතේ ඇඟලුම් සහ වෙනත් කම්හල් 200 ක් ග්‍රාමීය ප්‍රදේශවලට ස්ථානගත කිරීමට ඉලක්ක කර ඇත. මීට අමතරව කර්මාන්ත පුර / උද්‍යාන වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

1994 දී බලට පත් වූ රජය ද කර්මාන්ත ප්‍රතිපත්ති ඒ ආකාරයෙන් ම පවත්වාගෙන යන ලදි. මෙම රජය විසින් 1995 දී ශ්‍රී ලංකාවේ නව කාර්මීකරණ උපාය මාර්ග නැමති ප්‍රකාශය මගින් කාර්මික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදි. මෙහි විශේෂ අරමුණු කිහිපයක් තිබේ. කර්මාන්ත ප්‍රමාණය වැඩි කිරීම, කර්මාන්ත විවිධාංගීකරණය, කාර්මික භාණ්ඩ වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, භෞතික හා මිනිස් සම්පත් කාර්යක්‍ෂම හා කළමනාකරණය කිරීම, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල නව රැකියා ජනිත කිරීම, අපනයන නැඹුරුවක් ඇති කිරීම හා ප්‍රාදේශීය කාර්මිකරණයක් ඇතිකිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමුකර තිබිණි. මේ කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත 200 වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21 ක කර්මාන්ත 154 ක් වානිජමය නිෂ්පාදන අතරට එක්විය. 1980 දී පමණ ආරම්භ වූ කාර්මික ක්‍ෂේත්‍රයේ වර්ධනය වර්තමානය වන විට තරමක් වර්ධනීය අවස්ථාවකට ළඟා වී ඇත.



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාව - 2005

1970-1990 කාලය වන විට නිෂ්පාදන කර්මාන්තයේ වරධනයක් පෙන්නුම් කරන අතර 2006 වන විට 27% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 1998 දි කර්මාන්තවල අඩු වීමක් පෙන්නුම් කරයි. ඊට හේතුව වූන්නේ වගා අපනයන බෝග සැකසුම් කර්මාන්තවලට හිමිව තිබූ වැදගත් කම ප්‍රතිස්ථාපනය කෙරුනේ අනෙකුත් කර්මාන්ත මගින් වීමය. එසේම කුඩා පරිමාණ හා ගෘහස්ථ කර්මාන්ත පරිහානියට පත් විය. 20 වන

**තෝරා ගත් වර්ෂ කිහිපයක ශ්‍රී ලංකා ආර්ථික ව්‍යුහය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)**

| දායකත්වය | 1950 | 1970 | 1990 | 1998 | 2006 |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මය | 41 | 29.7 | 23.2 | 21.4 | 16.8 |
| නිමැවුම් කර්මාන්තය | 16.8 | 17.2 | 17.4 | 16.5 | 27 |
| සේවා | 35 | 42.6 | 49.6 | 53.2 | 56.2 |
| ඉදිකිරීම් කටයුතු | 6.8 | 10.0 | 6.8 | 7.1 | 7.2 |
| පතල් හා කැණීම් | 0.4 | 0.5 | 3 | 1.8 | 1.9 |

මූලාශ්‍රයඃ- සදරත්න 2004 වගු අංක 02

සියවස අග වන විට අනෙක් කර්මාන්ත වල දායකත්වය 85% ක් වූ අතර අපනයන බෝග සැකසුම් කර්මාන්තවල දායකත්වය 10% දක්වා ද සුළු පරිමාණ කර්මාන්ත අංශයේ දායකත්වය 4% දක්වා ද අඩු විය. අනෙක් කර්මාන්ත අංශය වර්ධනය වූයේ එහි පරාසයන් ද පුළුල් කරමින් නිමි ඇඳුම් නිෂ්පාදනය මෙලෙස ප්‍රසාරණය වී ඇත. මේ කරුණු අනුව 1999 වන විට අපනයන ආදායමේ දායකත්වය කර්මාන්ත අංශයෙන් 77%ක් විය. එය නිමි ඇඳුම් 53% ක්, රබර් ආශ්‍රිත නිෂ්පාදන 3.5% ක්, පිගන් භාණ්ඩ 1.1%ක්, සම්භාණ්ඩ 4.4%ක්, යන්ත්‍ර සූත්‍ර 4.4% ක් ආදී වශයෙන් එක්වී තිබේ. 2006 කාලය වන විට කර්මාන්ත අංශයේ සේවා නියුක්ති ප්‍රමාණය 26.6%ක් ද දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය 26.3% ක් ද වශයෙනුත් කර්මාන්ත වර්ධනයේ වේගය 7.2% ක් වශයෙනුත් පෙන්නුම් කර තිබේ. 2006 වන විට කෘෂිකාර්මික අංශය අභිබවා කර්මාන්ත ක්ෂේත්‍රය වර්ධනය වී ඇති බව හඳුනා ගත හැකිය.

### *ආශ්‍රිත ග්‍රන්ථ*


1. ඊරියගමල තිස්ස. ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයල ජාතික අධ්‍යාපන පදනම.
2. ජයතිලකල නිමල්. (1995) ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා ආර්ථික සංවර්ධනය, ඇස්. ගොඩගේ සහ සමාගම
3. ගමගේල ගුණසේන. එස්.අයි. (1998) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය
4. සදරත්නල නිමල් . (2004) ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජ සංවර්ධනයල ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් ඇන්ඩ් ඩිසයිනර්ල මහනුවර
5. ශ්‍රී ලංකා මහබැංකු වාර්ථාව(2006), මහ බැංකුව.
6. අර්ථනියාම අංක 2, (1967), "කර්මාන්ත පිහිටුවීම පිළිබඳ අත්‍යවශ්‍ය කරුණු කිහිපයක්."
7. කර්මාන්ත (1983 ) ජූලි, "දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සැකැස්මෙහි ගැටළු පිළිබඳ විග්‍රහයක්."
8. කර්මාන්ත (1983), ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනය ආශ්‍රිත ගැටළු.
9. කර්මාන්ත (1982) නොවැම්බර්, නිෂ්පාදන කර්මාන්ත ස්ථානගතවීමේ මූලික ලක්ෂණ.